# අකීකරු සෙනුට පාඩමක්



සෙනුලි කාරියවසම්

# අකීකරු සෙනුට පාඩමක්

සෙනුලි කාරියවසම්

කතා : සෙනුලි කාරියවසම්
චිත්‍ර : සෙනුලි කාරියවසම්

ISBN 978-624-208-510-4

# පිදුම

පොතක් ලියන්නට

මාගේ ඇස් පෑදූ

ආදරණීය ප්‍රමිතා වෙත්තසිංහ

ගුරු මෑණියන්ට

සෙනෙහසින් පුදමි......

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසා ය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේ ට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන '' හෙරණගත්කරණී'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

ඔන්න යාළුවනේ දවසක් සුරංගනාවියක් අම්මා කෙනෙකුට එක වාගේ ම ලස්සන චූටි දුවලා දෙන්නෙක් දීලා ගියා.

මේ දෙන්නට හැමෝම ආදරෙයි.



අම්මයි තාත්තයි මේ දෙන්නාට ආදරේට කතා කලේ සෙනු සහ තෙනු කියලා.

ආදරේ නිසාම ලස්සන ලස්සන සෙල්ලම් බඩු, රසම රස කෑම ජාති, මේ දෙන්නට ගෙනල්ලා දුන්නා.



එක දවසක් තාත්තා ගෙනත් දුන්න බෝනික්කත් එක්ක සෙනු තනියම සෙල්ලම් කළා.

නංගි එයාටත් ඕන කියලා කීවත් සෙනු නංගිට දුන්නේම නැහැ.

බෝනික්කා බෙදාගන්න දෙන්නම දෙපැත්තට ඇද්දා.



අන්තිමට බෝනික්කගේ අතක් කැඩුණා.

බිමට වැටුණු තෙනුත් තුවාල වුණා.



සමගියෙන් සෙල්ලම් කරන්න කියලා අම්මා අවවාද කලත් සෙනු ගේ අකීකරුකම අඩුවුණේ නැහැ.

මේක බලාගෙන හිටපු සුරංගනාවි හිතුවා අකීකරු සෙනුට දඬුවමක් දෙන්න ඕන කියලා.

ඉතින් සුරංගනාවි නත්තල් සියාට කිව්වා මේ පාර නත්තලට සෙනුට තෑග්ගක් දෙන්න එපා කියලා.



ඉතින් වෙනදා වගේම නත්තල් දවසේ සෙනු සහ තෙනු නත්තල් සීයාට ලියුමක් ලියලා නත්තල් ගහ යටින් තිබ්බා.




සෙනු අසාවෙන් හිටියේ එයාට අලුතෙන් සෙල්ලම් හාවෙක්ව ගෙනත් දෙයි කියලා.

උදේම ඇහැරුණු සෙනු සහ තෙනු නත්තල් ගහ ළගට දුවගෙන ගියා.

"මෙතන තියෙන්නේ එක තෑග්ගයිනෙ "

"ඒක මගේ එක මගේ " සෙනු කිව්වා.



" ඉන්න අපි බලමු කාගේ තෑග්ග ද කියලා" දෙන්නම කඩලා බැලුවා.

'' අනේ මේ මගේ සෙල්ලම් හාවා නෙවෙයිනේ ඔයාගේ පුසානේ. '' සෙනු දුකෙන් කිව්වා.



''නත්තල් සීයා මගෙත් එක්ක තරහා වෙලා'' ද සෙනු හොඳටම ඇඬුවා.

මේ වෙලාවේ තෙනුට දුක හිතුණා. ඔයා මගේ පුසා එක්ක සෙල්ලම් කරන්න තෙනු කිව්වා.

''ඔයා හරිම හොඳයි'' දෙන්නම සමගියෙන් සෙල්ලම් කළා.

එදා රෑ නින්දට ගියාම සුරංගනාවි සෙනු ළඟට ආවා. මම ඔය දෙන්නව එකටම එච්චේ හැම වෙලේම ආදරෙන් ඉන්න ඕන නිසයි.

රණ්ඩුවෙන්න එපා. සුරංගනාවී කියලා දුන්නා.

නත්තල් සීයාගෙන් ඉල්ල ගත්ත සෙල්ලම් හාවා කොට්ටය ළඟින් තියලා සුරංගනාවී යන්න ගියා.



උදේ නැගිටිනකොට ඇඳ උඩ තිබුණ හාවා ව දැකලා සෙනුට හරි සතුටුයි.

එයා නංගිටත් පෙන්නුවා ආයේ කවදාවත් ඒ දෙන්නා රණ්ඩු වුණේ නෑ.

සමගියෙන් හිටියා.



ඉතින් පුංචි යාළුවනේ, ඔයාලත් අයියලා, අක්කලා, නංගිලා සහ මල්ලිලා එක්ක රණ්ඩුවෙන්න එපා.

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත්, අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත්, සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළි දක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කළාප, පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංශන

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධිකාරක,

සෙනෙවිරත්න මහලේකම්

# ස්තූතිය

අකුරු කරන්නට සෙවන ලබාදුන් මහනුවර මහාමායා බාලිකා විදුහලේ විදුහල්පති තුමියටත්,

ප්‍රාථමික අංශයේ විදුහල්පති තුමියටත්,

පංතිභාර ගුරුතුමිය ප්‍රමිතා වෙත්තසිංහ ගුරු මෑණියන්ටත්, සියළුම ගුරු මෑණිවරුන්ටත්, පියවරුන්ටත්,

ආදරණීය අම්මා, තාත්තා, සහ නංගිටත් මාගේ ස්තූතිය පුද කරමි.



